# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වයි. ජී. පද්මසිරි මහතා විසින්
2013 මැයි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 අප්‍රේල් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[238 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL007246—750(2013/05)

# මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**1988 අංක 75 දරන මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2013 අංක දරන  මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1988 අංක 75 දරන ප්‍රධාන ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනතෙහි (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" වශයෙන් හැඳින්වෙන) දීර්ඝ නාමය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :—

"විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්‍රා ලේන් සුභසාධක සමිතිය සංස්ථාගත කිරීම සඳහා වන ආඥාපනත."

ප්‍රධාන ප්‍රඥප්තියට පොදු සංශෝධනය.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් ඕනෑම ලිඛිත නීතියක "මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත" යන්න "විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය සඳහා වන ආඥා පනත" යන වචන යෙදීමෙන් ආදේශ කළ යුතු ය.

(2) ඕනෑම රෙගුලාසියක, නීතියක, නිවේදනයක, දැනුම් දීමක, කොන්ත්‍රාත්තුවක, ඔප්පුවක, සංනිවේදනයක, නෛතික ලියවිල්ලක හෝ වෙනත් ලියවිල්ලක "මානසික උපප්‍රකෘති දරුවන්ගේ පාසලෙහි චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත" යන්නට කරනු ලබන සෑම සඳහනක් ම "විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ චිත්‍රා ලේන් ශුභ සාධක සමිතිය" ට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 (3) වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කළ යුතු වන්නේ ය:—

2- PL 007148 — 75 (2013/04)

"මරණයක දී, ඉල්ලා අස්වීමක දී, අයෝග්‍යතාවයක දී හෝ භාරකරුවකු තනතුරින් ඉවත් කරනු ලැබූ විට සංස්ථාවෙහි භාරකාර මණ්ඩලයෙහි ඇතිවන පුරප්පාඩුවක් සඳහා ඔහුගේ / ඇයගේ අනුප්‍රාප්තිකයාව සාමාජිකත්වය වර්ෂ දෙකකට නොඅඩු කාලයක් සම්පූර්ණ කර ඇති සංස්ථාවෙහි ඉතිරිව සිටින භාරකරුවන් විසින් පත් කළ යුතු ය. භාරකාර මණ්ඩලයෙහි සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව දහයකි.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.